# සවියෙන් පෙරට අපි එකට

## ඊ - ඉගෙනුම් පාසල

## හොරණ අධ්‍යාපන කලාපය

# බුද්ධ ධර්මය - 6 ශ්‍රේණිය

සැකසුම :- ආර්. ඩී. උදාරා ලක්මාලි

# 19 පාඩම
# අරපිරිමැස්ම දියුණුවට මගකි.

සැකසුම :- ආර්. ඩී. උදාරා ලක්මාලි
බප/හො/ පතහවත්ත ශ්‍රී ස්වර්ණජෝති මහා විද්‍යාලය





ජල නලයෙන් වතුර රැගෙන කරාම වසමු

තමන්ගෙ වැඩ අවසන් කොට විදුලිය නිවමු

ටිකක් ඉරුණු ඇඳුම මසා නැවතත් අදිමු

සකසුරුවම පුංචි කාලේ සිට ම හුරු වෙමු





මේ ජීවක වෛද්‍යවරයා ඉගෙනීම අවසන් කරලා ගෙදර එන දවස.එන අතරමගදී සාකේත නුවර සිටුතුමාගේ දේවිය හිසේ අමාරුවකින් පෙළෙන බව ආරංචි වුණා.



සිටු දේවියට ප්‍රතිකාර කරන්න ජීවක වෛද්‍යවරයා සිටු මාළිගාවට ගියා.

වෛද්‍යතුමා :- සිටු දේවියනි ඔබතුමිය කාලයක පටන් හිසේ මාරුවකින් පෙළෙන බව ආරංචි වුණා. ඒ සඳහා ප්‍රතිකාර කිරීමට මට අවස්ථාව ලබා දෙනු මැනවි.

සිටුදේවිය :- ඔබ තවමත් තරුණ වෛද්‍යවරයෙක්. මින් පෙරත් ඔබට වඩා වයසින් මුහුකුරා ගිය දක්ෂ වෛද්‍යවරුන් මට ප්‍රතිකාර කළා. නමුත් සුවයක් ලැබුණේ නැහැ.

වෛද්‍යතුමා :- සිටු දේවියනි, කරුණාකර ඔබතුමිය පරීක්ෂාකර බැලීමට මට අවසර ලබා දෙනු මැනවි.

වෛද්‍යතුමා :- සිටු දේවියනි ඔබතුමිය කාලයක පටන් හිසේ මාරුවකින් පෙළෙන බව ආරංචි වුණා. ඒ සඳහා ප්‍රතිකාර කිරීමට මට අවස්ථාව ලබා දෙනු මැනවි.

සිටුදේවිය :- ඔබ තවමත් තරුණ වෛද්‍යවරයෙක්. මින් පෙරත් ඔබට වඩා වයසින් මුහුකුරා ගිය දක්ෂ වෛද්‍යවරුන් මට ප්‍රතිකාර කළා. නමුත් සුවයක් ලැබුණේ නැහැ.

වෛද්‍යතුමා :- සිටු දේවියනි, කරුණාකර ඔබතුමිය පරීක්ෂාකර බැලීමට මට අවසර ලබා දෙනු මැනවි.

සිටුදේවිය :- හොඳයි, ඔබට අවසර ලබා දෙන්නම්.

වෛද්‍යතුමා :- ඔබතුමියට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය බෙහෙත් මා සතුව ඇත. නමුත් මා හට ගිතෙල් ස්වල්පයක් අවශ්‍යයි.

සිටුදේවිය :- සේවිකාවනි, ඉක්මනින් වෛද්‍යතුමාට ගිතෙල් ස්වල්පයක් ලබා දෙන්න.



සිටු දේවිය :-  සේවිකාවනි, මෙම බෙහෙත නශ්‍යා කිරීමේදී බිම් වැටුණු ගිතෙල් පුලුන් කැබැල්ලකට ගෙන ආරක්ෂා කර තබන්න.

(මෙම සිදුවීම කලකිරීමෙන් බලා සිටි ජීවක වෛද්‍යවරයා සිටු දේවිය ඉතා මසුරු තැනැත්තියක් ලෙස සිතීය.)

සිටු දේවිය :- වෛද්‍යතුමනි, බිමට වැටුණු තෙල් සේවිකාවක ලවා පුළුන් කැල්ලට රැගෙන පරිස්සම් කරන ලෙස උපදෙස් දුන් විට මම ලෝභී අයෙකු ලෙස වටහා ගත්තා නේද ? නැහැ, වෛද්‍යතුමනි අපි ගෙවල් වල ඉන්න අයනෙ. සම්පත්වල ආරක්ෂාව ගැන නිතර හිතනවා. අනවශ්‍ය ලෙස සම්පත් භාවිත කිරීමටත්, ඒවා ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙලා යනවා දකින්නටත් මම කැමති නැහැ. නශ්‍යයේ දී බිමට වැටුණු ගිතෙල් ටිකෙන් වුවත් බොහෝ ප්‍රයෝජන ගන්න පුළුවන්. එය ඇතැම් විට පහනක් දැල්වීමට භාවිත කරන්න පුළුවන්.
කනේ අමාරුවක් හැදුණොත් භාවිතයට ගන්නත් පුළුවන්. දුප්පත් අසරණ අයෙකුගේ අතේ පයේ ගැමට තෙල් බිංදුවක් ඉල්ලා සිටියොත් ලබා දෙන්නත් පුළුවන්.

ජීවක වෛද්‍යවරයාගේ ප්‍රතිකාර නිසා සිටු දේවිය සුවපත් විය. එබැවින් ජීවක වෛද්‍යවරයාට බොහෝ වස්තුව ලැබුණි.



# එදිනෙදා ජීවිතයේ දී සම්පත් අපතේ යන අවස්ථා



1. නිවසේ අනවශ්‍ය ලෙස විදුලි බල්බ දැල්වීම.



2. කාර්යාලවල අනවශ්‍ය ලෙස විදුලි බල්බ දැල්වීම.

3. අබලන් වූ උපකරණ අලුත්වැඩියා කර භාවිතා නොකිරීම.





4. ජල කරාම නිසි ලෙස නොවැසීම.



5. විදුලි පංකා සහ වායු සමන යන්ත්‍ර නිකරුණේ ක්‍රියාත්මක කර තිබීම.

- සම්පත් ආරක්ෂා කර ගැනීම පිළිබඳව බුදුරජාණන් වහන්සේ උපදෙස් දී ඇත.

- ඒ පිළිබඳව **අංගුත්තර නිකායේ කුල සූත්‍රයේ** සඳහන් වේ.

1. විනාශ වූ දේ වෙනුවට අලුත් දේ සපයා ගැනීම
2. දිරාගිය දේ සොයා බලා අලුත්වැඩියා කිරීම.
3. අසීමිතව ආහාරපාන ගැනීමෙන් වැළකීම
4. චරිතවත් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු නායකත්වයට පත් කිරීම.

සම්පත් අරපිරිමැස්ම යනු ලෝභකම නොවේ. අරපිරිමැස්ම යනු නාස්තියකින් තොරව සම්පත් භාවිතා කිරීමයි.

# ඇගයීම

1. ජීවකාරාම පූජා කතාව ඇතුළත් වන ග්‍රන්ථය කුමක්ද ?
2. බුදුරජාණන් වහන්සේ සම්පත් ආරක්ෂා කර ගැනීමට උපදෙස් දී ඇති සූත්‍රය කුමක්ද ?
3. සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට ඔබට කළ හැකි දේවල් 5ක් ලියන්න.

# පිළිතුරු



1. පූජාවලිය
2. කූල සූත්‍රය
3. ජල කරාම නිසිලෙස වැසීම.
   අනවශ්‍ය විදුලි බුබුළු නිවා දැමීම.
   පෑන්, පැන්සල්, මකන අවසන් වන තුරු පාවිච්චි කිරීම.
   ටිකක් ඉරුණු ඇඳුම් මසා නැවත ඇඳීම.
   විදුලි පංකා අවශ්‍ය අවස්ථා වලදී පමණක් ක්‍රියාත්මක කිරීම.